ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම

REDECO

රැකියා අවස්ථා

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අනුබද්ධිත සමාගමක් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

නිෂ්පාදන නිලධාරී - ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනම (පිරිමි)

මූලික සුදුසුකම් : නිෂ්පාදන කළමනාකරණය, නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව, කාර්මික ඉංජිනේරු විද්‍යාව, මෙහෙයුම් කළමනාකරණය හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව යන විෂයයන්ගෙන් උපාධියක් හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන, අදාළ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම හා වසර තුනක (03) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතුය.

සැපයුම් නිලධාරී - ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනම (පිරිමි)

මූලික සුදුසුකම් : ලොජිස්ටික් සහ සැපයුම් කළමනාකරණය, සැපයුම් දම කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, කළමනාකරණය, වාණිජ්‍යය යන විෂයයන්ගෙන් එකක් පිළිබඳ උපාධියක් හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන, අදාළ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම හා වසර තුනක (03) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතුය.

අලෙවි නිලධාරී - ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනම (පිරිමි)

මූලික සුදුසුකම් : අලෙවිකරණ කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය, වාණිජ්‍යය යන විෂයයන්ගෙන් එකක් පිළිබඳ උපාධියක් හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන, අදාළ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම හා වසර තුනක (03) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප : කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවීම ක්‍රියාත්මක වනු ඇත.(2026.01.01 දිනට මූලික වැටුප රු.65,633/= + ජීවන වියදම් දීමනාව රු.17,800/= සහ සමාගමේ අනුමත අනෙකුත් දීමනා)

වයස් සීමාව : අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියෙකු වියයුතු අතර, තනතුරට අදාළ රාජකාරී කාර්යක්ෂමව හා ආරක්ෂිතව ඉටු කිරීමට අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන, වෘත්තීය සහ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග **2026.12.01** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සහ නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම

නො.28/10A,කිරිමණ්ඩල මාවත.නාවල,රාජගිරිය